www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඇමරිකානු ධනවාදයේ කඩා වැටීමෙහි විප්ලවවාදී ඇඟවුම් -- 2 වන කොටස

**The revolutionary implications of the decline of American capitalism—Part 2**

**බැරී ග්‍රේ විසිනි**
**2008 ඔක්තෝබර් 14**

*ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාතික කර්තෘ බැරී ග්‍රේ 2008 අගෝස්තු 9 දා සසප ආරම්භක සම්මේලනයට ඉදිරිපත් කල වාර්තාවේ දෙවන කොටස පහත පල කෙරේ. එම සම්මේලනය විසින් ඒකමතිකව සම්මත කරන ලද සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශය සහ සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික හා ජාත්‍යන්තර පදනම් යන ලියවිලි අපි දැනටමත් පල කර ඇත්තෙමු.*

මේ සමඟ, සමාජ වියදම් කප්පාදුවත් බැංකු රෙගුලාසි ලිහිල් කිරීම හෝ ඉවත් කිරීමද ඇතුලත්, ව්‍යාපාරික ලාභ ඉපැයීම් මත පනවා තිබුනු සීමාවන් හකුලා දැමීමත් බැඳී තිබුනි.

1980 දශකය තුල, එක් අතකින් රැකියා මිලියන 10 ක විනාශයත්, අනෙක් අතින් මූල්‍ය සමපේක්ෂනයේ නව රූපාකාරයන්ගේ පැන නැගීමත් දැකගත හැකි විය. නය මත කෙරෙන ව්‍යාපාර මිලට ගැනීම් වල කැපී පෙනෙන වර්ධනයක්ද සිදු විය. උකස් නයකර ද ඇතුලත් විවිධ වර්ගයේ නයකරයන් බැඳුම්කර ලෙස ගොනු ගසා බැංකු, තැරැව්කාර ආයතන, විශ්‍රාමික අරමුදල්, රක්ෂන සමාගම් හා අනෙකුත් මහා ආයෝජකයන් වෙත විකුනා දැමීමේ සුරැකුම්කරනයේ ආරම්භයත් සමඟ බොල් බැඳුම්කරයන් පිලිබඳ සංසිද්ධිය හට ගත්තේය. සංගත හා බැංකු වල ආයෝජන ප්‍රතිපත්තීන් තීරනය කිරීමත්, පරියේෂනයේ සංවර්ධනයේ හා දිගු කාලීන සැලසුම් කරනයේ වියදමෙන් ක්ෂනික හා ඉහල ප්‍රති ලාභ නියම කිරීමේ, පෙර නො පැවති ප්‍රධාන කාර්ය භාරයක් කොටස් වෙලඳපොලට පැවරුනි. මෙහි ප්‍රතිපලය වූයේ ජනගහනයේ අතිමහත් බහුතරයකගේ වියදමෙන් ඉහලම සමාජ ස්ථරයන් ධනවත් කිරීමේ පදනම සම්පාදනය කල කඩදාසි වටිනාකම් හා නයකර, පෙර නොවූ විරූ ආකාරයෙන් කඳු ගැසීමයි. එක් නිදසුනක් දක්වන්නේ නම්, 1970 දී වැටුප් හා වේතන ජාතික ආදායමෙන් සියයට 75.4 කට වග කීවේය. 1986 දී එම ගනන සියයට 61 දක්වා වැටුනි. දශක ගනනාවක් පැවති ආර්ථික අසමානත්වය තුනී කිරීමේ රටාව පසෙකට දැමුනි.

''පශ්චාත් - කාර්මික සමාජය'' හා ''රේගන්ගේ විප්ලවය'' හුවා දැක්වූ ශාස්ත්‍රාලිකයන් හා මාධ්‍යකරුවන් මේ සියල්ලට නීති යුක්ත භාවය ගෙන දුන්නේය. යථාර්තය නම් 1980 ගනන් වලදී ඇමරිකානු ධනවාදයේ අත්තිවාරමෙහි විනාශකාරී දිරාපත් වීම දැක ගත හැකි වීමයි. 1981-86 අතර කාලයේ ලෝක අපනයනයේ එක්සත් ජනපද පංගුව සියයට 20 සිට 13.8 දක්වා වැටුනි. 1973-1983 අතර එක්සත් ජනපද වානේ නිපැයුම සියයට 44 කින් වැටුනි. රේගන් පරිපාලනය යටතේ ජාතික නයෙහි ප්‍රමානය දෙගුනයකටත් වඩා වැඩි විය.

1987 ඔක්තෝබරයේදී ව්‍යාපාර වස්තු වල අගය සියයට 23 කින් පහතට ඇද වැටෙද්දී වෝල් වීදිය ප්‍රතිශත අගය අනුව එක් දිනක් තුල දැවැන්තම කඩා වැටීමට මුහුන පෑවේය. දශකය අවසන් වූයේ ආයතන දහසකට වැඩි සංඛ්‍යාවක් බංකොලොත් කල හා ආන්ඩුව විසින් ඩොලර් බිලියන 160 ක ඇප වීමක් සංවිධානය කල ඉතුරුම් හා නය කඩා වැටීමකින්ය. ඇමරිකානු ධනවාදයේ ගෝලීය තත්වයෙහි තියුනු පරිහානිය සංගෘහිත වූයේ, එක්සත් ජනපදය පලවන ලෝක යුද්ධාවසානයේ පටන් පවත්වාගෙන ආ නය දෙන ජාතියක තත්වයේ සිට 1980 ගනන් වලදී ශුද්ධ නය ගැතියෙකු කරා පරිවර්තනය වීමෙනි.

ඇමරිකානු ධනවාදයේ ඊනියා මූල්‍යකරනය ක්ලින්ටන් හා ජෝර්ජ් බුෂ් ගේ කාලයන් තුල වේගවත් ව ඉදිරියට ගියේය. සංගත කැටි කිරීම් මාලාවක් හමුවේ මූල්‍ය සමපේක්ෂනය ආර්ථික ජීවිතයේ පෙර නොවූ විරූ දැවැන්ත ක්‍රියාකලාපයක් ඉටුකලේ නව හා වඩාත් පරපුටු රූපාකාරයක් අත්කර ගත්තේය. එකක් පසු පසින් තවත් සමපේක්ෂන බුබුලක් ඇතිවිය. නැගෙනහිර ආසියාවේ බිඳ වැටීම පසු පස ඩොට් කොම් බුබුල ඇතිවී නැතිව ගියේය. ඒ හා සමගම එම අඩුව පිරවීමට අවමුඛ උකස්කර බුබුල පැමිනියේය. නය පොකුරු ගැසීමේ ද්‍රශකයක් මඟින් තිරසාර කල, දැඩි-අවදානම් හා ඉහල-ප්‍රතිලාභ පිලිබඳ සංකල්පය මත පදනම්වූ ඇමරිකානු බැංකු ක්‍රමයේ නව ආකාතිය බවට පත් වූයේ නය සුරක්ෂිතකරනයයි. එය සලකන ලද්දේ නයෙහි වැඩි පංගුවක් ලෝකය පුරා අනෙකුත්

ආයෝජකයන් පිට පැටවීමට බැංකුවලට ඉඩ සලසන අසීමිතව ප්‍රසාරනය වීමේ විභවය සහිත ක්‍රමයක් ලෙසය.

එක්සත් ජනපදය තුල මූල්‍ය සමපේක්ෂනයේ වැඩී යාම පිලිබඳ දර්ශකයන් විශ්මය ජනකය. 1982 දී එක්සත් ජනපද මූල්‍ය සමාගම් වල ලාභය බදු ගෙවීමෙන් පසු ව්‍යාපාරයන්ගේ මුලු ලාභයෙන් සියයට පහක් පමනකි. 2007 දී ඒවා ව්‍යාපාර ලාභයෙන් සියයට 41 කට වග කීවේය. 1983-2007 අතර කාලයේ එක්සත් ජනපද දල දේශීය නිෂ්පාදිතයෙන් මූල්‍ය අංශයේ ලාභ වල පංගුව හය ගුනයකින් ඉහල නැගුනි. ලෝකයේ විශාලතම නයකාර ජාතිය වනතාක් දුරට එක්සත් ජනපදය ඩොලර් බිලියන 800 කට ආසන්න ජංගම ගිනුමේ හිඟයකට මුහුනපා සිටියි. අද දිනයේ එය පවත්වා ගන්නේ සෑම වසරකම ඩොලර් ට්‍රිලියනයක් විදේශ ප්‍රාග්ධනය ආනයනය කිරීමෙනි. වෙනත් වචන වලින් කිව හොත් සෑම වැඩකරන දික දීම බිලියන 4 බැගිනි,

සමාජය මුදුනෙහි පෙර නොවූ විරූ තිරස්චීන ධන සංකේන්ද්‍රනයත්, ආර්ථික පරපුටු භාවයේ යෝධ වැඩීමත් අතර ඓන්ද්‍රීය සම්බන්ධයක් පවතියි. දේශපාලන ප්‍රතිගාමීත්වයේ හා අපාලිත සමපේක්ෂනයේ වාතාවරනය තුල සමාගම් විධායකයන් වෙනුවෙන් ගෙවීම් ඇදහිය නොහැකි තරමින් වැඩිවී තිබේ. සමාජ ධනයෙන් පෙර නොවූ විරූ කොටසක් කම්කරු පන්තිය වෙතින් මූල්‍ය ප්‍රභුව වෙත පොම්ප කෙරෙයි. වෘත්තීය සමිති වල බිඳ වැටීම හේතු කොට ගෙන ජාතික ධනය මංකොල්ල කෑමට ප්‍රතිරෝධය දැක්වීමෙහි ලා සියලු මාධ්‍යයන්ගෙන් කම්කරු පන්තිය වියෝකර තිබේ.

## නව මූල්‍ය ප්‍රභූ පැලැන්තියේ සමාජ දේහ කාය

මෙහි ගෙන හැර දක්වන ක්‍රියාවලිය මඟින් එක්සත් ජනපද සමාජ ව්‍යුහයේ ඉමහත් වෙනස්කම් ඇතිකර තිබේ. සම්ප්‍රදායිකව ප්‍රධාන පන්තීන් දෙක අතර බෆරයක් ලෙස සේවය කල මධ්‍යම පන්තීන්ට අයත් දේපල හිමියන්, වෘත්තීය සේවකයන් හා කුඩා ගොවීන්ගේ ඉමහත් බහුතරය විනාශවී ගොස් විවිධ තරාතිරමින් කම්කරු පන්තියට ඇද වැටී තිබේ. පාලක පන්තියමත් සිය සමාජ දේහ කායේ දැවැන්ත වෙනස්කම් වලට මුහුනපා සිටිති. පරපුටු කමේ වර්ධනය නව මූල්‍ය ප්‍රභූ පැලැන්තියක් බිහිකර තිබේ. ඔවුන්ගේ ජීවන චර්යාව හා සමාජ පෙනුම සකස්වී ඇත්තේ ඔවුන් සතු ඉමහත් වස්තු සම්භාරය ගොඩ ගසාගෙන ඇති ධන සමුච්ඡයේ රූපාකාරයන් මඟිනි. දශක ගනනාවක් පැවතීගෙන ආ කොල්ලකාරී හා පසුගාමී දේශපාලන, සංස්කෘතික වාතාවරනය, පාලක පන්තිය තුලම ඇතිව තිබෙන වෙනස්කම් සැලකිල්ලට නොගෙන වටහා ගත නොහැක.

ඇමරිකාව ආර්ථික යෝධයෙකු ලෙස නැගී ඒම හා සම්බන්ධ කාර්මීකකරනයේ නියමුවන්, ප්‍රබුද්ධත්වයේ හා සංස්කෘතියේ විශිෂ්ඨතමයන් නොවූ බව මෙහිලා අවධාරනය කිරීම කිසිසේත් අවශ්‍ය නොවේ. කෙසේ වෙතත් ඔවුන්ගේ වාසනාව, නිෂ්පාදන බලවේගවල තත්‍ය සංවර්ධනයක් මූර්තිමත් කල කාර්මික අධිරාජ්‍යයන් වර්ධනය වීමත් සමඟ බැඳී තිබුනි. අද දින පාලක ප්‍රභුව තුල දේශපාලනිකව කැපී පෙනෙන බලවතුන් හා සුපිරි ධන කුවේරයන් බොහෝ දුරකට එක්සත් ජනපදයේ නිෂ්පාදන පදනමෙහි දිරාපත් වීම සමඟ සම්බන්ධය. ෆෝර්ඩ්, කානගී, ඩියුපොන්ට් හා රොකෆෙලර් ලා සිය ධනය රැස්කර ගැනීමට දශක ගනනාවක් ගතකල ද, අද දින රක්ෂිත අරමුදල් හිමි ප්‍රකෝටිපතියන් ද, බැංකුකාර ධන කුවේරයන් ද ඒ ආකාරයේ වස්තු සම්භාරයන් ගොඩගසා ගත්තේ වසර කිහිපයක ඇවෑමෙනි. එදි නෙදා ජීවිතයේදී ඔවුන් වියදම් කරන ධන පරිමාව දශක ගනනාවකට පෙර නම් ඇදහීමට පවා නොහැකිය. නව මූල්‍ය ප්‍රභුව සිය මුදල් උපයා ගන්නා ආකාරය, එහි ප්‍රමානය පසෙකින් තැබුව ද, අනුව සාපරාධිත්වයේ පැතිර ගිය මූලයක් අවශ්‍යයෙන්ම ඔවුන්ගේ සමාජ පැවැත්මෙහි කොටසක් බවට පත්ව ඇත.

රක්ෂිත අරමුදල් සභාපති හෙන්රි පෝල්සන් අවමූඛ උකස් වෙලඳපොලේ බිඳවැටීම මත ඔට්ටු අල්ලමින් 2007 වසරේදී බිලියන 3.7 ක් සාක්කුවේ රුවා ගත් අතර ඉහලම රක්ෂිත අරමුදල් කලමනාකරුවන් 50 දෙනා අත් කරගත් මුදල බිලියන 29 කි. එම අගය මිලියන 35.5 ක ජනගහනයක් ඇති කෙන්යාවේ වාර්ෂික දදේනි සමාන වන අතර මිලියන 20 ක ජනගහනයකින් යුත් ශ්‍රී ලංකාවේ දදේනි වඩා අඩු වන්නේ ඩොලර් බිලියනයකින් පමනි. යමෙකු 2007 වසරේ පෝල්සන්ගේ ආදායම දින 365 න් බෙදුව හොත් ඔහුට ලැබෙන උත්තරය දිනකට ඩොලර් එක් කෝටි එක් ලක්ෂ තිස්හත් දහසකි. මෙය පැයකට 422374 ක් ද, විනාඩියකට 7040 ක් ද තත්පරයකට 117 ක් ද වේ. පෝල්සන් සති 52 වාර්ෂික වැඩ රටාවකට අනුව සතියකට පැය 40 ක් වැඩකරන්නේ යයි යමෙකු සිතාගත හොත්, එවිට ඔහුගේ පැයක ''වැටුප'' එක්සත් ජනපදයේ සාමාන්‍ය කම්කරුවෙකුගේ පැයක වැටුප මෙන් 24136 ගුනයකි.

මෙහි පවත්නා සමාජ මූල ධර්ම අනුව ගතහොත් එක්සත් ජනපදය සියලු ප්‍රමුඛ ධනේශ්වර රටවල් අතරින් වඩාත්ම අතාර්කික හා පසුගාමී රට බවට පත්ව තිබීම ගැන යමෙක් පුදුම විය යුතු ද? වෙනත් ඕනෑම රටක් පරයා යන මිලියන 2.2 ක රැඳවියන් සංඛ්‍යාවකින් යුත් එක්සත් ජනපදයේ ඉහල නඟින බන්ධනාගාර ජනගහනය පෙන්නුම් කරන්නේ සමාජ සම්බන්ධතාවන්ගේ දුස්සාධ්‍ය තත්වයයි. 2008 වසර ආරම්භයේ සෑම වැඩිහිටි ඇමරිකානුවන් සියයකින් එක් අයෙකුට වැඩි ගනනක් සිරගත කොට තිබුනි. සමාජ ජරපත් බවේ තවත් එක් දර්ශකයක් නම් ඇමරිකාවේ විශාලතම නගර 50 උසස් අධ්‍යාපනය ලබන

සිසුන්ගෙන් සියයට 40 කට වැඩි ප්‍රමාණයක් උපාධි ලබා ගැනීමට අසමත්ව තිබීමේ කාරනයයි. අද එක්සත් ජනපදයේ ජීවිත අපේක්ෂාව සිංගප්පූරුව, කොස්ටාරිකා හා දකුනු කොරියාවට වඩා පහලින් 42 වන තැන රැඳී තිබේ.

ධනවත් හා මනා දේශපාලන සම්බන්ධතා සහිත පවුලක දැන උගත් කමෙන් අඩු උරුමක්කාරයා වන ජෝර්ජ් බුෂ් තුලින් , සංගත මූල්‍ය ප්‍රභූවේ මනාව අංග ලක්ෂිත සාපරාධිත්වයේ දේශපාලන පුද්ගලාරෝපනය යමෙකුට දැක ගත හැකිය. එහෙත් ඇමරිකානු දේශපාලන සංස්ථාපිතයේ කුමන කොටසක් තුලින් හෝ ඉහල සුධීමත් භවයක් හෝ සදාචාරාත්මක ආයාමයකින් යුක්ත කෙනෙකු සොයාගැනීම දුෂ්කරය.

ඇමරිකානු පාලක පන්තියේ සමාජ දේහ කායේ වෙනස්වීම, එක්සත් ජනපද විදේශ පිලිවෙත හැඩ ගැස්සීමෙහි ලා සැලකිය යුතු කාර්ය භාරයක් ඉටුකර තිබේ. 1980 ගනන් වල පටන් අප නිරීක්ෂනය කර තිබෙන ආකාරයට වැඩිවන වාර ගනනින් ද, ප්‍රචන්ඩ ලෙස ද මිලිටරි මාධ්‍යයේ පිහිට පැතීම වනාහි එක්සත් ජනපදයේ පිරිහෙන ආර්ථික තත්වය කෙරෙහි දක්වන ප්‍රතිචාරයකි. මෙම ප්‍රවනතාවය පැරනි සෝවියට් සංගමයේ හා නැගෙනහිර යුරෝපයේ ස්ටැලින්වාදී තන්ත්‍රයන්හි බිඳ වැටීමෙන් පසුව වඩාත් පැහැදිලි හා නිශ්චිත ආකාරයකින් ඉස්මතුවී තිබේ.

වසර අසූවකට පෙර ට්‍රොට්ස්කි ඉමහත් දූරදර්ශී භාවයකින් පරි කල්පනය කල පරිදි ඇමරිකානු ධනවාදයේ අර්බුදය,, කවර අර්ථයකින් හෝ එහි ප්‍රචන්ඩ නැඹුරුව හීන කරනවා වෙනුවට එහි ප්‍රති විරුද්ධ දිශාවට යොමු කර තිබේ. 1928 කොමින්ටර්නයේ (තුන්වන ජාත්‍යන්තරය) කෙටුම්පත් ක්‍රියාමාර්ගය පිලිබඳ සිය විවේචනය තුල ට්‍රොට්ස්කි මෙසේ පැවසීය. ''ඇමරිකානු ප්‍රතිපත්තියේ පොදු දිශානතිය, විශේෂයෙන්ම එහි ආර්ථික දුෂ්කරතාවන් හා අර්බුදයේ කාලයකදී, යුරෝපයේ පමනක් නොව සමස්ත ලෝකයෙහිම ගැඹුරු හැල හැප්පීම් අවුලුවා ලීම කරා යොමුවනු ඇත.''

මිලිටරිවාදය අභ්‍යන්තර වශයෙන් ඇවිලී යන සමාජ ආතතින් කෙරෙහි පලවන ප්‍රතිචාරයක් ද වේ. සමාජ අසමානතාවය ඉමහත් ලෙස ප්‍රසාරනය වීමේ කොන්දේසි යටතේ අභ්‍යන්තර විරෝධතා ත්‍රස්ත කරමින් හා මඩිමින් දේශීය නොසංසුන්තාව පීලි පැන්නවීමේ මාධ්‍යයන් ලෙස යුද්ධය උපයෝගී කර ගනියි.

පාලක පන්තියේ අභ්‍යන්තර කුනුවීම හා එහි මුඳුන කොල්ලකාරී මෙන්ම සාපරාධී ප්‍රභවයන් අතට පත් වීම, ප්‍රතිපත්ති තීන්දු කිරීමේදී හා ඒවා ක්‍රියාවට නැඟීමේදී යොදා ගන්නා ක්‍රම වේදයන්ට බලපා තිබේ. ඇමරිකානු ධනේශ්වරය සිය ආර්ථික කටයුතු කලමනාකරනය මඟින් පෙන්නුම්කර ඇති අකාර්යක්ෂමතාවය ද ඇතුලුව නොඉවසිලිවන්ත කම, අදූරදර්ශී භාවය හා තකතිරු කම එහි විදේශ පිලිවෙත තුල ද පිලිඹිඹු වේ. පහත දැක්වෙන්නේ ආක්‍රමන, ගුවන් ප්‍රහාර, යටත් කර ගැනීම් යනාදී වශයෙන් වූ පසුගිය සියවස් කාල තුල එක්සත් ජනපදයේ ඍජු මිලිටරි මැදිහත්වීම් වල ලැයිස්තුවකි. 1983 ලෙබනනය, 1983 ග්‍රෙනේඩාව, 1986 ලිබියාව, 1989 පැනමාව, 1991 ඉරාකය, හා ඉන්පසු 12 වසරක අඛන්ඩ ගුවන් ප්‍රහාර, 1991-93 සෝමාලියාව, 1994 හයිටිය, 1998 ඇෆ්ගනිස්ථානය, 1998 සුඩානය, 1999 ස්රබියාව, 2001 සිට අද දක්වා ඇෆ්ගනිස්ථානය, 2003 සිට අද දක්වා ඉරාකය, 2004 හයිටිය, 2006 සෝමාලියාව, දැනට පකිස්ථානය. මීට අමතරව ඇෆ්ගනිස්ථානය, නිකරගුවා, එල් සැල්වඩෝරය, හොන්ඩුරාස්, ගෝතමාලාව, කාම්බෝජය, මොසැම්බික්, ඇන්ගෝලාව හා පැරනි යුගෝස්ලාවියාව ඇතුලු රටවල, දුසිම් ගනනක් වූ එක්සත් ජනපද රහසිගත මිලිටරි මෙහෙයුම් හා අනුග්‍රාහක යුද්ධ මීට ඇතුලත්ය. දේශීය පෙරමුනේ මෙන්ම ලෝක කරලියේ ද ඇමරිකානු පාලක ප්‍රභූව වඩ වඩාත් අවනීතිය හා මැර ක්‍රියාවල යෙදී සිටියි.

## ඇමරිකානු කම්කරු ව්‍යාපාරයේ ජරපත් වීම හා බිඳ වැටීම

ඇමරිකානු කම්කරු ව්‍යාපාරයේ පරිහානි ගත වීම, ඇමරිකානු ධනවාදයේ පරිහානියට සමාන්තරව සිදුවී තිබේ. මෙය අහම්බයක් නොවේ. පාලක පන්තියේ මූලෝපායික හා ආර්ථික ජයග්‍රහන වලට කම්කරු පන්තියේ සංවිධානවල ව්‍යසනාව මෙතරම් ඍජු හා සමීප ලෙස ගැට ගසා දැමූ කම්කරු නිලධරයක් වෙනත් කිසිදු රටක ඇත්තේ නැත. වෘත්තීය සමිති සාමාජිකත්වය හා වැඩ වර්ජන වල පහලට නැඹුරුවූ පරාවක්‍රය යමෙක්, ඇමරිකානු කර්මාන්තයේ පරිහානිය සමඟ සැසඳුව හොත් ඔහුට කැපී පෙනෙන සාදෘෂ්‍යයක් සොයාගත හැකිවනු ඇත. ධනේශ්වර දේපල හා ජාතිකවාදය ආරක්ෂා කිරීම මත පදනම්වූ කම්කරු සංවිධාන වල ශක්‍යතාවය පිලිබඳව ඉතිහාසය පුලුල් අත්හදා බැලීමක්, කම්කරු පන්තිය සඳහා ඛේදනීය වූ, කර අතුවා සේය. වෘත්තිය සමිති සාමාජිකත්වය, පුද්ගලික අංශයේ ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස සිවසකටත් පෙර පැරනි වැඩ ශිල්පීය ආධිපත්‍ය යටතේ පවති ඇමරිකානු කම්කරු සම්මේලනය අත්කරගෙන තිබුනු මට්ටම් වලටත් වඩා පහත, තනි ඉලක්කමකට වැටීමත් කම්කරු පන්තියේ ජීවන මට්ටම් හා සමාජ තත්වයේ ව්‍යසනකාරී වැටීමත් මෙම ඓතිහාසික තීන්දුවට ඇතුලත්ය.

මහා අවපාතය කාලයේ සමාජ කාලකන්නිකමට හා කාර්මික ඒකාධිකාරයට එරෙහිව කම්කරු පනතියේ නැගිටීම් වලින් උපත ලැබූ මහා කාර්මික සමිති, එක් අතකින් බලගතු ඇමරිකානු කම්කරු පන්තියේ සටන්කාමීත්වය හා සහයෝගිතාවය ද අනෙක් අතට නව සංවිධාන ඩිමොක්‍රටික් පක්ෂයටත්, ධනේශ්වර රාජ්‍යයටත් යටත් කල නායකත්වයේ වහල් භාවය හා

සංස්ථිතික භාවය ද අතර දැවැන්ත ප්‍රති විරෝධයක් ගැබ්කර ගත්තේය. නිලධරයෙහි දේශපාලන ඉදිරිදර්ශනයේ පදනම මත සීඅයිඕ හි නො වැලැක්විය හැකි පරිහානිය පිලිබඳව ෆ්ලින්ට් වාඩිලා ගැනීමේ අරගලයෙන් දෙවසරක් ඉක්ම යන්ටත් පෙර ට්‍රොට්ස්කි අනතුරු අඟවා තිබුනි. සංක්‍රමන ක්‍රියාමාර්ගය තුල ඔහු මෙසේ ලිවීය. ''එක්සත් ජනපදය තුල කාර්මික සමිති ගත වීම (සිඅයිඕ) තුල සිදුවූ විශ්මයජනක හා වේගවත් වර්ධනය ද, පෙර නොවූ විරු වාඩිලා ගැනීමේ අරගල රැල්ල ද වනාහි ඇමරිකානු කම්කරු පන්තිය ඉතිහාසය විසින් තමන්ට අනවා ඇති කර්තව්‍යයන්ට ගැලපෙන මට්ටමකට තෙමේම නගී ගැනීමට දරන සහජාසිය ව්‍යායාමයේ වඩාත් අවිවාදිත ප්‍රකාශනයයි. එහෙත් මෙහිදී ද, මෑතක නිර්මානය කල සීඅයිඕව ද ඇතුලත් පෙරටුගාමී දේශපාලන සංවිධාන මහජනතාවගේ විප්ලවකාරී බලය ඇන හිටුවීම හා පක්ෂඝාත කිරීම සඳහා තමන්ට හැකි සියලු දෙයක් ම කරනු ඇත.''

ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය සඳහා සටනේ පෙරමුනේම පිහිටුවන්නාවූ, ප්‍රතිගාමී නායකයන්ට එරෙහිව කම්කරුවන් මෙහෙයවීමේ මාධ්‍යයන් ලෙස, සීඅයිඕව රූස්වෙල්ට්ගෙන් බිඳී වෙන් වෙමින් සමාජවාදී ක්‍රියාමාර්ගයක් මත පදනම්වූ කම්කරු පක්ෂයක් පිහිටුවිය යුතු යයි ඉල්ලීම් කරන ලෙසට ට්‍රොට්ස්කි, සමාජවාදී කම්කරු පක්ෂය (එස්ඩබ්පී) ට බල කලේය.

සීඅයිඕ නායකත්වය ස්ටැලින්වාදීන්ගේ ද උදව් ඇතිව කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක පැනැගීම වැලක්වූහ. එහි ප්‍රතිපලයක් ලෙස, මෝටර් රථ හා කර්මාන්තයේ තවත් සමහර අංශවල ආරම්භක ජයග්‍රහන වලින් පසුව සීඅයිඕ පිහිටුවන ලදී. එය තම තත්වය තහවුරු කර ගත්තේ දෙවන ලෝක යුද්ධය ආසන්නයේ හා යුද්ධ කාලය තුල යුද ව්‍යායාමයේ නාමයෙන් වැඩ වර්ජන මැඬ පවත්වා කම්කරු විනය පිහිටුවීමේදී ලබාදුන් සහායට හිලව් වශයෙන් රූස්වෙල්ට් පරිපාලනයේ සහාය ඊට ලැබීමත් සමඟ පමනකි. මෙම ධනපති ව්‍යාපාරික පදනම මත, යුද වකවානුව තුල සීඅයිඕ සාමාජිකත්වය නාටකාකාර ලෙස ඉහල නැගුනේ එහි මෙන්ම ඊට අනුබද්ධ සමතිවල භාන්ඩාගාරයන් ද තරකරමිනි. කම්කරු සංඛ්‍යාලේඛන මන්ඩලයට අනුව, සමිති සාමාජිකත්වය සහිත වේතන හා වැටුප් කම්කරුවන්ගේ ප්‍රතිශතය එහි ඉහලම මට්ටමට ලඟා විය. ඒ 1945 වසරේ සියයට 36 ක් දක්වාය.

යුද්ධයෙන් පසුව සීඅයිඕව ඇමරිකානු ධනවාදය හෝ කාර්මික ප්‍රජාතන්ත්‍රවාදය සඳහා හෝ පැවති සෑම ඉල්ලීමක්ම පාහේ අතහැර දැමූහ. ඒඑෆ්එල් සමිති ව්‍යාපාරය ද සමඟ එක්ව එය ඇමරිකානු ධනවාදයේ ව්‍යාප්තවාදී උත්සුකයන් සමඟ පෙල ගැසෙමින් සෝවියට් සංගමයට එරෙහිව සීතල යුද්ධයේ ප්‍රති කොමියුනිස්ට්වාදී කුරුස යුද්ධයට ඇතුල් විය. සීඅයිඕව ගොඩනැගීමට පාදක වූ දැවැන්ත අරගලයන්හි තීරනාත්මක ක්‍රියාකලාපයක් ඉටුකල සමාජවාදී හා වාමාංශික බලවේග රුදුරු ලෙස විරේක කිරීම සඳහා සමිති නිලධරය පියවර ගත්තේය. ප්‍රති කොමියුනිස්ට්වාදී දඩයම කම්කරු නිලධරයේ මූලික දේහ කාය හැඩගස්වනු ලැබූ අතර කම්කරු ව්‍යාපාරයේ අවසන් දිරාපත් වීම හා බිඳවැටීම සඳහා පදනම දැමීය. 1955 වසරේ ඒඑෆ්එල් හා සීඅයිඕ එකාබද්ධය, සැලකිය යුතු සමාජ වෙනසක් සඳහාවූ ඉදිරිදර්ශනය සමඟ ඇමරිකානු කම්කරු ව්‍යාපාරයට පැවති සම්බන්ධයේ අවසානය සලකුනු කලේය. එක්සත් ජනපදයේ විශාලතම සමිතිය වූ ලොරි රියැදුරන්ගේ සමිතිය මාෆියා කල්ලි විසින් පාලනය කිරීමේ කාරනය පමනක් වුවත් සමස්තයක් වශයෙන් ඇමරිකානු වෘත්තීය සමිති වල ධනේශ්වර ගැති දිශානතියේ වඩාත්ම ජුගුප්සා ජනක ප්‍රකාශනය වන්නේය.

පසුගාමිත්වය, තකතිරුකම, දූෂිතකම හා අමු මැවරකම වෘත්තීය සමිති ව්‍යාපාරයේ නිර්නිත ලක්ෂනය බවට පත්ව තිබේ. කම්කරු පන්තියට එහි ඇති සම්බන්ධතාවය අතිශය නග්න ආකාරයට ප්‍රකාශයට පත් වූයේ මධ්‍යම රහස් ඔත්තු සේවයේ (සීඅයිඒ) කම්කරු පෙරමුනු ඇමරිකාවේ නිදහස් ශ්‍රම සංවර්ධන ආයතනයක් ලෙස හඳුන්වා දෙමින් එය සමඟ සහයෝගී වෙමින් ඒඑෆ්එල්-සීඅයිඕ සිය ක්‍රියාකාරීන් ලෝකය පුරා වාමාංශික සමිති හා දේශපාලන සංවිධාන වලට එරෙහිව ප්‍රති විප්ලවවාදී ප්‍රචන්ඩත්වය යෙදවීම සඳහා යොමු කිරීමත් සමඟය. ඇමරිකානු අධිරාජ්‍යවාදයට එහි සේවය ඉටුකිරීමේදී ඒඑෆ්එල්-සීඅයිඕ ව ලතින් ඇමරිකාවේ, ආසියාවේ, මැද පෙරදිග හා අප්‍රිකාවේ මිලිටරි ආඥාදායකත්වයන්, ඝාතක කල්ලි හා ෆැසිස්ට්වාදී සංවිධාන සමඟ පෙල ගැසුනේය. ඒර්වින් බ්‍රවුන්ගෙන් පසුව හිටපු ස්ටැලින්වාදියෙකු වූ ජේ ලව්ස්ටන් විදේශයන්හි ඒඑෆ්එල්-සීඅයිඕවේ ප්‍රති විප්ලවවාදී කටයුතු වල ප්‍රධාන ක්‍රමවේදියා බවට පත් විය. ඒඑෆ්එල්-සීඅයිඕ හි ප්‍රති විප්ලවවාදී ඉදිරිදර්ශනය හා එය ඇමරිකාවේ රාජ්‍ය ආරක්ෂක සංස්ථාපිතයට ඒකාබද්ධ විමෙන් එක්සත් ජනපදය තුල ඇතිකල ප්‍රති විපාක 1955 න් ආරම්භවී 1970 ගනන්වලින් පසුව වේගවත් වූ සමිති සාමාජිකත්වය ඛාදනය වීමේ ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරයි.

1970 ගනන් වලින් ආරම්භවූ ඇමරිකානු කර්මාන්තයේ තියුනු පරිහානිය හා අන්තර් ජාතික සංගතයන්හි නැගීම ද භූගෝලීය නිෂ්පාදනය ද, සිය සාමාජිකයන්ගේ අවශ්‍යතාවන් සීමිත ආකාරයකින් හෝ ආරක්ෂා කිරීමට සමිති වලට තිබූ හැකියාවට වල කැපීය. ඒඑෆ්එල්-සීඅයිඕව කිසිදු බැරෑරුම් ප්‍රතිරෝධයක් නොදක්වන බවට දුන් පූර්ව ප්‍රතිඥාව නොමැතිවූයේ නම් පැට්කෝ ගුවන් ගමන් පාලකවරුන්ට එරෙහි සිය

පලිගැනීම රේගන් විසින් ඉදිරියට ගෙන යනු ඇතැයි සිතිය නොහැකිය. ඒඑෆ්එල්-සීඅයිඕව සිය සාමාජික සමිතියක් විනාශ කිරීමට එකඟ කර ගැනීම සමිති බිඳීමේ මෙහෙයුම සාර්ථක කර ගැනීමේදී තීරනාත්මක විය. 1980 ගනන් වල සමිති බිඳිම හා වැටුප් කප්පාදුවට එරෙහි නිමක් නැති කම්කරු අරගල වලදී කම්කරවන්ට සටන් වැදීමට සිදුවූයේ හාම්පුතුන්ට හා රාජ්‍යයට විරුද්ධව පමනක් නොව තමන්ගේම සමිති නායකයන්ගේ ද්‍රෝහිත්වයට එරෙහිවත්ය. ඒඑෆ්එල්-සීඅයිඕ ක්‍රමානුකූලව ඔවුන්ගේ අරගල හුදෙකලා කර පරාජය කිරීමට වග බලා ගත්හ.

ඒඑෆ්එල්-සීඅයිඕහි ප්‍රතිගාමී හා පසුගාමී දේශපාලනයේ පූර්න ප්‍රති විපාක හෙලි දරව් කරනු ලැබුනේ ඔවුන්, පාලක පන්තිය පන්ති යුද්ධයේ පිලිවෙත් කරා මාරුවීම හමුවේ කම්කරු පන්තිය මුලුමනින්ම නූසූදානමේ තැබුවේය යන කාරනයෙනි. කම්කරු නිලධරයේ පැත්තෙන් ගත් විට වැටුප් වැඩිකරීම හා වෙනත් පහසුකම් වෙනුවෙන් මැදිහත් වීමේ සිට වැටුප් කප්පාදුව, කම්හල් වැසීම හා පූර්වයෙන් ලබාගත් ආර්ථික සහන වැනසීමට සහායදීම දක්වා වූ මාරුව කිසිදු අභ්‍යන්තර අරගලයකින් හෝ දෙගිඩියාවකින් පවා තොරව සිදුවිය. පශ්චාත් යුද කාලීන උත්පාතය බිඳ වැටීමේ හා ඇමරිකානු ධනවාදයේ ගෝලීය තත්වයෙහි පරිහානියේ කොන්දේසි යටතේ එහි ධනේශ්වර ගැති හා ජාතිකවාදී දේශපාලනයේ තර්කාන්විත ප්‍රතිපලය එය විය.

අද දින සමිති වල ව්‍යාපාර ගැති හා ප්‍රජාතන්ත්‍ර විරෝධී ස්වභාවය ද පාලක ප්‍රභූවේ හා රාජ්‍යයේ අන්ඩක් ලෙස කටයුතු කරන මධ්‍යම පන්තික සමාජ ස්ථරයක උපකරන දක්වා සිදුවූ ඔවුන්ගේ පරිවර්තනය එක්සත් මෝටර් රථ කම්කරු සමිතිය (යූඒඩබ්) දැවැන්ත ව්‍යාපාරික සංස්ථාවක් බවට පත්වීම මගින් මූර්තිමත් කරයි. කම්කරුවන්ගේ වැටුප් අඩකින් කපා හැරීම, විශ්‍රාමික හා සෞඛ්‍ය පහසුකම් අහෝසි කිරීම මෙන්ම අතිරේක රැකියා දස දහස් ගනනක් අතුගා දැමීම සඳහා සහාය දීමට හිලව් වශයෙන් යූඒඩබ් ඉහල සමිති නිලධාරීන් ධනවතුන් බවට පත්කරන්නාවූ ඩොලර් බිලියන ගනනාවක සෞඛ්‍ය රක්ෂන භාරකාර අරමුදලේ පාලනය ඔවුනට ලැබුනි.

සියලු වර්ගයේ අවස්ථාවාදී හා සංශෝධනවාදී දේශපාලන නිර්මිතයන්හි පොදු ලක්ෂනය වූයේ සමිති කෙරෙහි වන පූජනීය ආකල්පයත්, ඔවුනගේ අධිකාරය ''කම්කරු පන්තියේ මහා සංවිධාන''ලෙස නීත්‍යානුකූල යයි හුවා දැක්වීමත් ය. මෙය වනාහි, යථාර්තයේදී වෘත්තීය සමිති නිලධරය ආරක්ෂා කිරීමක් මෙන්ම ඩිමොක්‍රටික් පක්ෂයට දේශපාලන සේවය සැපයීමක් වන තරයේම සාවද්‍ය හා දේශපාලනිකව ප්‍රතිගාමී ආස්ථානයකි. සමාජවාදී සමානතා පක්ෂය කම්කරු පන්තියට එහි පැරනි පක්ෂ ගැන සත්‍යය කියා දෙයි. අපි ඒඑෆ්එල්-සීඅයිඕ හෝ එහි හවුල්කාර ''ජයග්‍රහනය සඳහා වෙනස'' නම් සන්ධානයේ පතුරු ගිය විශ්වාසනීයත්වය නඟා සිටුවීම ප්‍රතික්ෂේප කරන්නෙමු. මෙම සංවිධාන වනාහි, හැකිලී ගිය පසු පෙල සාමාජිකත්වයට කිසිදු පාලනයක් කල නොහැකි දක්ෂිනාංශික නිලධරයේ උපකරනයන්ය. ඔවුන්ගෙන් කැඩී වෙන් වෙමින් කම්හල් හා වැඩපොල කමිටු වැනි අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදී හා සටන්කාමී සංවිධාන ගොඩනැගීම සඳහා අපි ඔවුන් දිරිමත් කරන්නෙමු. සියල්ලටමත් වඩා, සමිති වලින් පිටස්තරව සිටින අති මහත් බහුතරයත් ඇතුලත් කම්කරුවන්ට, ද්වි පක්ෂ ක්‍රමයෙන් හා ඩිමොක්‍රටික් පක්ෂයෙන් කැඩීම ද, කම්කරු පන්තියේ ජාත්‍යන්තර එකමුතුව හා සමාජයේ සමාජවාදී පරිවර්තනයක් සඳහා සටන් වදින ස්වාධීන මහජන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීමේ අවශ්‍යතාව ද, අපි පැහැදිලි කරන්නෙමු.

## ඔබාමා හා ඇමරිකානු ලිබරල්වාදයේ පිරිහීම

වෘත්තීය සමිති නිලධරයේ මූලික දේශපාලන කාර්ය භාරය වන්නේ කම්කරු පන්තිය ඩිමොක්‍රටික් පක්ෂය හරහා ඇමරිකානු ධනේශ්වරයේ ලිබරල් කොටස්වලට යටත් කර තැබීමයි. ඔබාමාගේ ව්‍යාපාරය ඇමරිකානු ලිබරල්වාදයේ ජරපත් වීම සමඟ බැඳී ඇති ඓතිහාසික, දේශපාලන හා දෘෂ්ඨිමය ක්‍රියාවලියක තර්කාන්විත ප්‍රතිපලයයි. ඔබාමා යනු දශක හතරකට ආසන්න, හරියටම නම් එක්සත් ජනපදයේ ආර්ථික පරිහානිය ආරම්භවී වේගවත්වූ දශක ගනනාවකට ආසන්න කාල පරිච්ඡේදය පුරා අනවරතයෙන් සිදුවූ අනන්‍යතා දේශපාලනය හුවා දැක්වීමේ අවසාන ප්‍රතිපලයයි.

දිග්ගැස්සුනු පරිහානියේ අවධිය පුරා ඇමරිකානු ලිබරල්වාදය සමාජ පන්ති පිලිබඳ ප්‍රශ්නය සඟවා තැබීමට උත්සාහ කලහ. දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු කාලයේදී ලිබරල්වාදය, අවපාත කාලයේ පෙනී සිටි ඒකාධිකාරයන් පිලබඳ විවේචන, ''ආර්ථික රාජකීයන්'' පිලිබඳ හෙලාදැකීම් හා යම් ආකාරයක කාර්මික ප්‍රජාතන්ත්‍රවාදය මෙන්ම වැඩි ආර්ථික සමානතාවයක් සමඟ ධනවාදයේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරන සඳහා පෙනී සිටීම මුලුමනින්ම අතහැර දැමූහ. පශ්චාත් යුද්ධ ලිබරල්වාදය සිය අවධාරනය යෙදුවේ ධනය නිෂ්පාදනය හා ධනය නිෂ්පාදකයා මත නොව පාරිභෝජනය හා පාරිභෝජකයා මතය. ඩිමොක්‍රටික් පක්ෂය තවදුරටත් ''වැඩකරන මිනිසා'' ගේ පක්ෂය ලෙස හැඩ ගැන්වීම නතර කල අතර ''මධ්‍යම පන්තියේ'' පක්ෂය බවට පත් විය. 'මධ්‍යම පන්තියේ' ප්‍රීතිමත් ජීවිතය සහතික කරන ලද්දේ ව්‍යාපාරික ලෝකයට සුඛිත මුදිත විය හැකි වාතාවරනය සකස්කිරීම හා වෙලඳපොල ආර්ථිකයට පූර්න සේවා නියුක්තිය හා ජීවන තත්වයන් නඟාසිටුවිය හැකි බව පැවසීම මගින්ය. වෘත්තීය සමිති මෙම නව ලිබරල් ඉදිරිදර්ශනයට අනුගත වෙමින් බැරෑරුම් ආර්ථික

ප්‍රතිසංස්කරන සඳහා කුමන අරගලයක් හෝ අතහැර දැමූහ.

මෙම මාරුව, දකුනට පැදීමේ හා ඇමරිකානු අධිරාජ්‍යවාදය අනුගමනය කල සීතල යුද්ධ ප්‍රති කොමියුනිස්ට්වාදයේ කැත හා ලජ්ජා සහගත රූපාකාරය වැලඳ ගැනීමේ කොටසක් ද විය. වේගයෙන් හා බොහෝකොටම එකහඬින් ප්‍රති කොමියුනිස්ට්වාදය කරාවූ ලිබරල් ශාස්ත්‍රාලිකයේ මෙ නැඹුරුව ප්‍රවේශමෙන් සලකා බැලිය යුතු සංසිද්ධියකි. සල්ලිවලට ගැනීමේ හා දූෂනය කිරීමේ පෙර නොවූ විරූ පරිමානය ද ඇතුලුව ඇමරිකානු ධනවාදයේ ඉමහත් ධනය හා බලය සමඟ එහි ද්‍රව්‍යමය මූලයන් ගැටගැසී තිබුනි.

එහෙත් දෘෂ්ඨිමය හා දේශපාලන සාධක ද නොතිබුනේ නොවේ. 1996 දී පැවැත්වූ ''සමාජවාදය ඓතිහාසික සත්‍යය හා එක්සත් ජනපදයේ දේශපාලන චින්තනය'' නම් ඩේවිඩ් නොර්ත්ගේ දේශනයේදී පැහැදිලි කල පරිදි ඇමරිකානු ලිබරල් ශාස්ත්‍රාලිකයේ සැලකිය යුතු කොටස් මහා අවපාතයේ හා ෆැසිස්ට්වාදය හිස එසවූ අඳුරු වසරවලදී සෝවියට් සංගමය වෙත ආකර්ශනය වූහ. කෙසේවුව ද විශේෂ අවස්ථා කිහිපයකදී හැරුනු කොට, ''සෝසසසං ''ලිබරල් මිතුරන්,'' තමන් අනුගමනය කරන්නේ මාක්ස්වාදයේ හා ඔක්තෝබර් විප්ලවයේ මූලධර්ම හා සම්ප්‍රධායන් යයි කියාපෑ ස්ටැලින්වාදී තන්ත්‍රය අවිවේචනාත්මකව පිලිගත්හ. ඇමරිකානු ලිබරල් චින්තනයේ ප්‍රමිති ලාංඡනය වූ ඓතිහාසික හා න්‍යායික ප්‍රශ්න පිලිබඳව දක්වන මූලධර්ම විරහිත හා තත්කාර්යවාදී ආකල්පය ඒකාධිපති මොස්කවු තන්ත්‍රය වෙත වාමාංශික ලිබරලුන් හා රැඩිකලුන් ඇද බැඳ ගැනීමේ තෝතැන්න විය.

1940 ගනන්වල දෙවන භාගයේදී පැනනැඟි ප්‍රති-කොමියුනිස්ට්වාදී හා ප්‍රති-සෝවියට්වාදී උමතුව, 1936-38 අතර කාලයේ ස්ටැලින් විසින් සංවිධානය කල හොර නඩු කෙරෙහි එක්සත් ජනපද ලිබරල් සංසදයන් කෙරෙන් පොදුවේ පලවූ සහාය මඟින් ප්‍රතිවිරුද්ධ ආකාරයකට පෙනී ගියේ වී නමුත්, පූර්ව නිශ්චය වී තිබුනි. අධ්‍යාපනඥයෙක් හා දර්ශනවාදියෙක් වූ ජෝන් ඩිවේගෙන් පලවූ ආකාරයේ ගෞරවනිය සුවිශේෂී අවස්ථා කිහිපයකදී හැරෙන්නට, ස්ටැලින්ගේ මුසාවාද හෙලිදරව්කර හොර නඩුවල ගොදුරු බවට පත්ව සිටි ට්‍රොට්ස්කි ඇතුලු අනෙකුත් පැරනි බොල්ෂෙවිකයන් නිදොස් කිරිම සඳහා විකල්ප විනිශ්චය සභාවක් වෙනුවෙන් සහාය දෙන ලෙසට ට්‍රොට්ස්කි කල කැඳවුම ලිබරල් ශාස්ත්‍රාලිකයන් විසින් ප්‍රතික්ෂේප කලේය. යුද්ධයෙන් පසුව ලෝක තත්වය නාටකාකාර ලෙස වෙනස්වූ හා එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සීතල යුද්ධය දියත් කල තත්වය තුල, ස්ටැලින්ගේ අපරාධ ආරක්ෂා කිරීමේදී ස්ටැලින්වාදය මාක්ස්වාදය හා සමාජවාදී විප්ලවය සමඟ අනන්‍ය කල එම දෘෂ්ඨිමය පදනම, ප්‍රති කොමියුනිස්ට්වාදී දඩයම යුක්ති සහගත කිරීමේදී ද ඔවුන්ගේ පදනම බවට පත් විය. ඇමරිකානු ප්‍රති කොමියුනිස්ට්වාදයේ අසාමාන්‍ය සාහසිකත්වයටත්, ඒ කෙරෙහි පලවූ සංවිධානාත්මක ප්‍රතිරෝධයේ මන්දගාමීත්වයටත්, දායකවූ දේශපාලන සාධක අතරට, කම්කරු පන්තියේ පුලුල් කොටස්වල දැඩි පිලිකුලට පාත්‍රවූ ඇමරිකානු ස්ටැලින්වාදීන්ගේ වංකකමේ හා නරුමත්වයේ පරිමාව ද ගිනිය යුතුය. එසේ වුවත් ලිබරල් ප්‍රති කොමියුනිස්ට්වාදය වනාහි, ස්රැලින්වාදයට දකුනෙන් එල්ලකල කපටි හා නරුම ප්‍රහාරයකි. එය සලකුනු කලේ, ප්‍රජාතන්ත්‍රවාදී සමාජ චින්තනයට කුමන හෝ බැරෑරුම් දායකත්වයක් සම්පාදනය කල හැකි ප්‍රවනතාවක් ලෙස එහි අවසානයයි.

කෙනඩි හා ජොන්සන් පරිපාලනයන් සීතල යුද්ධ ඇමරිකානු ලිබරල්වාදයේ පරිසමාප්තිය සලකුනු කලේය. රට තුල සීමිත සමාජ ප්‍රතිසංස්කරන හා ජනප්‍රිය කයිවාරු ද, විදේශයේදී ප්‍රති විප්ලවය ද එකට ගැලපීමට ඩිමොක්‍රටික් පක්ෂය දැරූ උත්සාහය බිඳ වැටුනි. ජර්මන් වෛමාර් (හිට්ලර්ගේ නාසිවාදී) වේ හොඳම කාලයෙන් පසුව දැකගත හැකිවූ ඉහලම ම්ලේච්ඡත්වයේ හා ප්‍රචන්ඩත්වයේ මට්ටම සලකුනු කල වියට්නාම් යුද්ධය, සීතල යුද්ධ ලිබරල්වාදයේ ප්‍රති විප්ලවවාදී සාරය එලිමහනට ගෙන ආවේය. එය ඩිමාක්‍රටික් පක්ෂයේ දේශපාලන විශ්වාසනීයත්වයට එල්ලකල ප්‍රහාරයෙන්, පක්ෂය කිසි දිනෙක ගොඩ ආවේ නැත.

නරක අතට හැරෙන ආර්ථික කොන්දේසි මඟින් දහනය කල වියට්නාම් යුද්ධයේ. සිවිල් අයිතිවාසිකම් අරගලවල, නාගරික කැරලි හා වැඩ වර්ජන රැල්ලෙහි බලපෑමෙන් රූස්වෙල්ට් යටතේ ගොඩනගන ලද නව ගිවිසුමේ සභාගයට වලකැපුනි. පශ්චාත් යුද්ධ ඇමරිකානු ලිබරල්වාදයේ හා එය වැලඳගෙන සිටි ''මධ්‍යම පන්තික'' පාරිභෝගික සමාජයේ විශ්වාසනීයත්වය රඳ පැවතියේ යුද්ධයෙන් පසුකාලයේ අඛන්ඩව සිදුවූ ආර්ථික ප්‍රසාරනය හා අත්වැල් බැඳගෙන වැඩී ගිය සමෘද්ධිය මතය. එහෙත් 1960 ගනන් අවසන් වසරවල උත්පාතය බැස යාමට පටන් ගත්තේය. වසර කිහිපයක් තිස්සේ ඩිමොක්‍රටික් පක්ෂය නව පිලිවෙතේ සමාජ ප්‍රතිසංස්කරන දේශපාලනයෙන් විවෘතවම දුරස්ත වෙමින් සිටියේය.

පශ්චාත් යුද කාලීන තුනී සමාජ ප්‍රතිසංස්කරන පිලිවෙතින් ඉවතට ගමන්කරන අතර ඩිමොක්‍රටික් පක්ෂය 1972 දී මැක්ගවර්න් ව්‍යාපාරයේ ආරම්භයත් සමඟ යලි හැඩ වැඩ වීමේ උත්සාහයක නිරත විය. දුරදිග යන ප්‍රතිසංස්කරන ලෙස ඉදිරිපත් කල වැඩ පිලිවෙල තුල පක්ෂ සංවිධානය එකක් මත තවෙකක් වශයෙන් ''සහභාගිත්වයේ'' කොටස්වලින් සරසන ලද අතර එන්ට එන්ටම වාර්ගික හා ලිංගික විවිධත්වය එහි ආදර්ශ පාඨය බවට පත් විය. පක්ෂය අනන්‍යතා

දේශපාලනයේ මූලධර්මය එහි ව්‍යුහය තුලටම ඇතුලු කර ගන්නා ලදී. අප්‍රිකානු- ඇමරිකානු හා ලතින් ඇමරිකානු මෙන්ම සුදු ජාතික පුළුල් වැඩකරන ජනතාවගේ ජීවන තත්වයන් එකතැන පල්වෙන හෝ පිරිහෙන තත්වය තුල ''අඩු වරප්‍රසාදිතයන්ට සහන සැලසීම'' වැනි ප්‍රතිපත්තීන් යොදාගනු ලැබුවේ විවිධ රැඩිකල්, වාර්ගික හා කාන්තා කන්ඩායම් අතර ඉහල පැලැන්තීන් වෙත වරප්‍රසාද සැලසීමටය.

ඩිමොක්‍රටික් පක්ෂය සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරය, කලුජාතික හා අනෙකුත් සුලු ජන සංවිධාන, කාන්තා සංවිධාන සම ලිංගික අයිතීන් පිලිබඳ කන්ඩායම්, පරිසරවාදීන් ආදී එකිනෙකා සමඟ තරඟයේ යෙදී සිටින වඩාත් වරප්‍රසාදිත ස්ථරයන් ඇතුලත් නොගැලපෙන සංවිධානයක රූපය ගත්තේය. පැරනි නව සම්මුතියේ සභාගය තුල ප්‍රමුඛ ක්‍රියාකලාපයක් ඉටුකල වෘත්තීය සමිති ඩිමොක්‍රටික් පක්ෂය සමඟ සන්ධානගතව සිටි බොහෝ බලපෑම් දැමීමේ කන්ඩායම් අතර එකක් බවට පත්විය. ඩිමොක්‍රටික් පක්ෂය විසින් අනන්‍යතා දේශපාලනය වැලඳ ගැනිම තවදුරටත් එහි දකුනට පැද්දීමේ අනිවාර්ය ලක්ෂනයක් විය. ''ප්‍රගතිශීලී'' දේශපාලනයේ මුරගල් ලෙස නැඟී සිටි වර්ගය හා ලිංගිකත්වය, ඇමරිකානු ලිබරල්වාදය විසින් ආර්ථික සමානතාවය හා ව්‍යාපාරික-මූල්‍ය පැලැන්තියේ බලය සීමාකිරීම ද ඇතුලත් ප්‍රජාතන්ත්‍රවාදයේ කුමන හෝ සංකල්පයක් ප්‍රතික්ෂේප කිරීමට දායකත්වය සම්පාදනය කලේය.

1950 හා 60 ගනන්වල අප්‍රිකානු-ඇමරිකානු ජනතාවන්ගේ ඓතිහාසික සිවිල් අයිතිවාසිකම් අරගලයන්හිදී එම ව්‍යාපාරය පන ගැන්වූ ප්‍රජාතන්ත්‍රීය හා සමානාත්මතා ආවේශයන් ජනවාර්ගික වෙනස්කම් කිරීම හා දුගී භාවයට එරෙහි දේශපාලන යොමුව, වරනීය සැලකුම් හා සුලු කොටසකගේ වරප්‍රසාද අරමුනු කරගත් පිලිවෙතකට මාරුවීමත් සමඟ වල පල්ලට ගියේය.

ඔබාමා ව්‍යාපාරය යටින් ඇත්තේ මෙම ක්‍රියාවලීන්ගේ ප්‍රතිගාමී ස්වභාවයයි. බරාක් ඔබාමා නමැති පුද්ගලයා සීමාන්තික අවස්ථාවාදය හා යම් දේශපාලන කෘත හස්ත භාවයක ලක්ෂන පෙන්වන අතර, චිකාගෝ ඩිමොක්‍රටික් පක්ෂ දේශපාලනයේ රුදුරු හා දූෂිත ක්‍රම තුලින් ආධුනිකත්ව අධ්‍යාපනය ලබාගත්තේය. ඔහුගේ බහු වාර්ගික දෙමාපිය සම්බන්ධය සිය වාසියට හරවා ගනිමින් බහු සංස්කෘතිකවාදී කෝනයන් උපයෝගී කර ගැනීමට ඔහු උගත්තේය. ඔහුගේ අපේක්ෂකත්වය තුල, ඇමරිකානු සමාජයේ පන්ති ස්වභාවය සැඟවීම සඳහාත් කම්කරු පන්තිය ව්‍යාකුල කර බෙදීම සඳහාත් අනන්‍යතා දේශපාලනය යොදා ගැනීමට දරන උත්සාහය, ඇමරිකානු අධිරාජ්‍යවාදයට එහි පරිසමාප්තිය සඳහා වඩාත් ''ප්‍රජාතන්ත්‍රවාදී'' මුහුනුවරක් ලබා දෙයි.

මැතිවරනයේ ප්‍රතිපලය කුමක් වුවත් කම්කරු පන්තිය දැනට මත් ඔබාමා ගැන වැදගත් අත්දැකීම් ලබා ඇත. ජනාධිපති අපේක්ෂකත්වය ලැබූ තැන් පටන් හුස්ම අල්ලන තරම් වේගයෙන් හා එක පැහැර සිදුවූ ඔබාමාගේ දකුනට පැදීම, ඩිමොක්‍රටික් පක්ෂය සේවය සපයන සමාජ අවශ්‍යතා හා අනන්‍යතා දේශපාලනය පිලිබඳ මිත්‍යාවන් දුරු කරමින් මාහැඟි පාඩමක් ගෙන එනු ඇත. බලාපොරොත්තුවේ අධිරාජ්‍යයා ඇඳුම් නොමැතිව සිටියි. කම්කරු පන්තිය වෙත පිරිනැමීමට, තව තවත් යුද්ධ, දුගී භාවය, බිය හා මර්ධනය හැරෙන්නට ඔහු සතුව වෙන කිසිවත් ඇත්තේ නැත.

## කම්කරු පන්තියේ මහා අරගල වල නව යුගයක්

එක්සත් ජනපදයෙහි සමාජවාදී සමානතා පක්ෂය පිහිටු වීමේදී අපි කම්කරු පන්තියේ දේශපාලන දිශානතියෙහි මාරුවක් පූර්වාපේක්ෂා කරන්නෙමු. ලෝක දේශපාලන තත්වය හා එය එක්සත් ජනපදය තුල පිලිඹිබුවීම සම්බන්ධ ඓතිහාසික හා ද්‍රව්‍යමය විශ්ලේෂනයක පදනමෙහි සිට අපි කම්කරු පන්තියේ මහා අරගලයන්හි නව අවධියක් විශ්වාසයෙන් යුතුව සංකල්පනය කර ඒ සඳහා සූදානම් වන්නෙමු.

සිය වසකට ආසන්න කාලයක සිට ලෝක ධනවාදයේ තෝතැන්න වූ එක්සත් ජනපදය කවර කලෙක වත් නොතිබුනු තරමේ ආර්ථික, සමාජ හා දේශපාලන අර්බුදයකට මුහුනපා සිටියි. පුලුල් වැඩකරන ජනතාවගේ ජීවන තත්වයන් වේගයෙන් පිරිහෙමින් ද, දශක ගනනාවක නොතැකීමෙන් පසුව රටේ යටිතල ව්‍යුහය බිඳ වැටෙමින් ද, නව මූල්‍ය ප්‍රභුවකගේ ප්‍රතිගාමී හා පසුගාමී ගොඩ වෙදකම් මඟින් දේශපාලන හා සංස්කෘතික ජීවිතය කාබාසිනියා වෙමින් ද තිබේ.

එක්සත් ජනපදය සියලු කාර්මික ජාතීන් අතුරින් වඩාත්ම අසමාන වූ රට බවට පත්ව තිබේ.. ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් නිරන්තරව ප්‍රහාරයට ලක්වෙයි. දිලිඳු කම, විරැකියාව, කායික හා මානසික රෝගී භාවය, අධ්‍යාපන පරිහානියේ වර්ධනය වීම පෙන්වන සියලු සමාජ දර්ශකයන් ඇඟවුම් කරන්නේ පසු පසට යන සමාජයකි.

මෙය ප්‍රගතිශීලී ආකාරයකට විසඳීමේ සමත් එකම සමාජ බලවේගය වන ඇමරිකානු හා ජාත්‍යන්තර කම්කරු පන්තියේ විප්ලවවාදි ව්‍යාපාරයකින් හැර ඇමරිකාවේ සමාජ අර්බුදයෙන් ගොඩ ඒගත හැකි වෙනත් මාවතක් ඇත්තේ නැත. සිවිල් යුද්ධයේදී වහල් භාවය අහෝසි කිරීමේ පටන් මහා අවපාගයේ සමාජ කාලකන්නිකමට හා කාර්මික ඒකාධිකාරයට එරෙහි අරගලයත්, 1950-60 ගනන්වල සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරයත් දක්වා වූ ඇමරිකාවේ සියලු ප්‍රගතිශීලී මහා වෙනස්කම් පෙරට ගෙන ගියේ වැඩකරන ජනතාවගේ මහා ව්‍යාපාරයන් මඟිනි.

සමස්ත සමාජ පර්යායේ හටගෙන ඇති අර්බුදයක් දැන් කම්කරු පන්තියට දැවැන්ත ඓතිහාසික කාර්ය භාරයක් මුන ගස්වා ඇත. එය ගත යුත්තේ සමාජවාදී විප්ලවයේ මාවතයි.

සමාජ විප්ලවය සඳහා වෛෂයික පූර්වාවශ්‍යතාවන් වේගයෙන් මෝරමින් තිබේ. ඇමරිකානු ධනවාදයේ ඉමහත් ආර්ථික සම්පත් හා කාර්මික බලය, කම්කරු පන්තියේ පුලුල් කොටස්වල සාපේක්ෂ ඉහල ජීවන තත්වයන්, ප්‍රජාතනත්‍රවාදී සමාජයක් ලෙස එක්සත් ජනපදයට පැවති ප්‍රතිරූපය වැනි එක්සත් ජනපදයේ සමාජවාදී විප්ලවය පැන නැඟීමට එරෙහිව මීට පෙර හරස් කරන ලද සියලු වෛෂයික කොන්දේසි අහෝසිවී හෝ වේගයෙන් ඛාදනය වෙමින් තිබේ.

කම්කරු පන්තියේ දේශපාලනික සවිඥානකත්වයේ වරධනය අවහිර කිරිමට තමන් සතු සියලුම ආයතන මෙතරම් රුදුරු ලෙස මෙහෙයවීමට උත්සාහ දරන පාලක පන්තියක් වෙනත් කිසිඳු රටක ඇත්තේ නැත. අනවරත ප්‍රචාරනය හා මර්ධනය එකට කවලම් කිරීමෙන් සමාජවාදය ප්‍රසිද්ධ කරලියෙන් තහනම් කර නැතුවා පමනි. එහෙත් ''ඇමරිකානු සිහිනය,'' හා ''ඇමරිකාවේ ජීවන තත්වය'' වැනි අතුරු වැකි වලින් ද කියාපාන ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදය පිලිබඳ මිත්‍යා ප්‍රබන්ධ ඇමරිකානු සමාජ යථාර්තය විසින් අමූලික මුසාවාද ලෙස හෙලිදරව් කර තිබේ.

නව මිලිටරි ජන සංහාරයකට මානව වර්ගයා ඇද දමන හා මිලියන සිය ගනනක් ජනතාව සමූලඝාතනය කිරීමට එය සමත් විය හැකි නමුත්, ඇමරිකානු ධනේශ්වරයට අවි බලය මඟින් එහි ගෝලීය පරිහානිගත වීම ආපසු හැරවිය නොහැකිය. තීරනාත්මක ප්‍රශ්නය නම් කම්කරු පන්තියේ නව විප්ලවවාදි නායකත්වයක් ගොඩ නැඟීමයි. එය, දේශපාලන බලය තම අතට ගෙන සමාවාදි සමාජයක් නිර්මානය කිරීම සඳහා කම්කරවන්, මනාව ගොඩ නැංවූ ක්‍රියාමාර්ගයකින් හා මූලෝපායකින් සන්නද්ධ කල යුතුය.

කම්කරු පන්තියේ පැරනි නායකත්වයන් දිගු කාලයක පටන් සිය බංකොලොත් කම හා ද්‍රෝහිත්වය ප්‍රදර්ශනය කර ඇත. ජාතික ස්වෝත්තමවාදයේ හා ප්‍රති කොමියුනිස්ට්වාදයේ තෝතැන්න වූ ඒඑෆ්එල්-සීඅයිඕ නිලධරය, දශක ගනනාවක් තිස්සේ කම්කරු පන්තියේ සටන්කාමී ප්‍රතිරෝධය මැඩීම සඳහා කැපව සිටි අතර සිය සංවිධනයම බිඳ වැටිම කරා මෙහෙයවා තිබේ.

මධ්‍යම පන්තික විරෝධතා කන්ඩායම් හා ''වාම'' සංවිධාන ගල්රෝල, මුලු හිතින්ම කම්කරු පන්තියේ ස්වාධින දේශපාලන ව්‍යාපාරයක් ඉස්මතු විම වැලැක් විමට වැඩ කරති. ඩිමොක්‍රටික් පක්ෂය ලෙස ප්‍රකට ඇමරිකානු ලිබරල්වාදයේ මලකුන වටා ඔවුන් රැස් කකා සිටින්නේ කුමන වියදමකින් හෝ කම්කරු පන්තිය එහි කක්ෂය තුල සිරකොට තැබීමටය.

හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සමඟ දේශපාලන සහයෝගයෙන් කටයුතු කරන සමාජවාදී සමානතා පක්ෂය පමනක් කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය හා ජාත්‍යන්තර එකමුතුව සඳහා සටන් වදියි. ඇමරිකානු ධනවාදයේ අර්බුදය මඟින් මතුකර ඇති මූලික කාර්යය නම් සසප ගොඩ නැඟීම හා එය ඇමරිකානු කම්කරු පන්තියේ මහජන විප්ලවකාරී පක්ෂය බවට පරිවර්තනය කිරීම සඳහා දේශපාලනික, න්‍යායික හා සංවිධානාත්මක පදනම් පිහිටුවීමයි.

**සමාප්තයි**

© www.wsws.org